# ලෝක ජල දිනයට සම්මන්ත්‍රණයක්

ලෝක ජල දිනය මාර්තු 22 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සම්මන්ත්‍රණයක් සංවිධානය කර තිබුණි. ලෝක ජල දිනයේදී මෙවර තේමාව වී ඇත්තේ "ජලය සහ සංස්කෘතිය" යන්නයි. පාසැල් ළමුන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ ගුරුභවතුන්, පුහුණු කිරීමේ නිලධාරීන් රැසක් මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ වර්තමාන ජලය භාවිතා කිරීමේදී පැන නගින ගැටළු, එසේම ජල හිඟයට පිලියම් ආදිය ගැන සාකච්ඡා කිරීමටත් නියමිත අතර, ජලය වටිනා සම්පතක් වන හෙයින් විශේෂයෙන් පාසැල් ලමුන් අතර එහි වටිනාකම පිළිබඳ අවබෝධයක් ලබාදීම කාලෝචිතය. එසේම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලී සිටින ගුරුභවතුන් මඟින් මෙම පණිවිඩය සිසුන් අතර ප්‍රචාරය කිරීමත් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පුහුණු කටයුතුවල නිරත නිලධාරීන් මඟින් ගොවි ජනතාව දැනුවත් කිරීමත් මෙම වැඩසටහනේ එක් අරමුණක් විය.

ලෝක ජල දිනයට අනුබද්ධව ශ්‍රී ලංකාවේ වර්තමාන තත්වය හා ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අදාල බලධාරීන් දැනුවත් කිරීමද තවත් අරමුණක් වූ අතර විශේෂයෙන් ජලය අරපරිස්සමින් භාවිතා කිරීමට ගොවි ජනතාව පෙළඹවීමත්, පැසැල් ලමුන් මඟින් දෙමව්පියන් හා මහජනතාව දැනුවත් කිරීමට ගනු ලබන එක් පියවරක් ලෙස මෙම සම්මන්ත්‍රණය සංවිධානය කෙරුණි.

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂිකා ආචාර්ය පීනාදරී ද සොයිසා මහත්මියගේ ප්‍රධානත්වයෙන් ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පැවැත්වෙන මෙම සම්මන්ත්‍රණයේදී, ජල චක්‍රය, ජල සංරක්ෂණය, ජල සංරක්ෂණයේදී සමාජයේ කාර්යභාරය සහ ජලය, සෞඛ්‍යය හා සනීපාරක්ෂාව යන මාතෘකා ඔස්සේ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරු රැසක් දේශන පැවැත්වූහ.